www.agaram.lk

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

ඒකක පරීක්ෂණය

11 ශ්‍රේණිය | සිංහල සාහිත්‍ය සංග්‍රහය | ඒකකය 10 - කැරගලය වැජඹෙයි මේ ලෙසින් සිට.

(1) පහත සඳහන් ප්‍රශ්න සඳහා කෙටි පිළිතුරු සපයන්න.

1) මේ කවි පන්තියට අයත් සංදේශ කාව්‍ය කුමක් ද?
2) එය ලියවී ඇත්තේ කිනම් යුගයකදී ද?
3) එහි රචකයා හඳුන්වන නම සඳහන් කරන්න.
4) මෙම නිර්මාණය රචිත යුගයේ මෙරට විසූ පාලකයා කවුරුන් ද?
5) මේ සන්දේශ කාව්‍යයේ නිමිත්ත කෙටියෙන් දක්වන්න.
6) එම නිමිත්ත වෙනුවෙන් ආශිර්වාද ලබා ගැනීමට නියම වූ කිනම් දෙවිවරුන්ගෙන් ද?
7) එම නිමිත්ත වෙනුවෙන් දේශනා කළ පිරිත් සූත්‍රය කුමක් ද?
8) එම සූත්‍රය කොපමණ වාර ගණනක් සජ්ඣායනා කලේද?
9) මේ සන්දේශ කාව්‍ය රචකයාගේ වෙනත් කාව්‍ය නිර්මාණ මොනවා ද?
10) මේ සන්දේශය හා සම්බන්ධ දූතයාගේ ගමන් මග කුමක් ද?

(2) පහත ප්‍රශ්න සඳහා පිළිතුරු ලෙස කෙටි සටහන් ලියන්න.

1) කැරගල ගමේ වූ සොභාව සෞන්දර්‍යයේ අපූර්වත්වය,
2) කැරගල ගමේ සීමා මායිම්,
3) කවි පන්තියේ වූ එළිසමයාලංකාරය,
4) කැරගල ගම් පියසේ සශ්‍රීකත්වය,
5) කැරගල විහාරස්ථානයේ වට පිටාව,

(3) කවි පන්තියේ ඇති,

1) දෙවන කවිය
2) හයවන කවිය
3) අටවන කවිය යන කවි වල සරල අර්ථය ලියා දක්වන්න.

(4) විචාර ප්‍රශ්න

1) i) උචිත උපමා භාවිතය,

ii) ඖචිත්‍ය ශබ්ධාලංකාර,

භාවිතය නිසාම කැරගල පද්‍ය පන්තිය සාර්ථක වී ඇත. විමසීමක් කරන්න.
(එකකට උදාහරණ දෙක බැගින් වචන 125 ක් සෑහේ.)

2) අපේ පැරණි ගමක අනන්‍යතාව කැරගල ගම් පියසෙන් දිස් වේ. පැහැදිලි කිරීමක යෙදෙන්න.
(එකකට උදාහරණ තුනක් ගෙන, වචන 100 ක් සෑහේ.)

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk